# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2096/67 - 2018 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2018.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් 2018 නොවැම්බර් මස 05 දිනැති අංක 2096/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, 2018 නොවැම්බර් මස 09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උප ලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2018 නොවැම්බර් මස 09 වන දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


1A - G 28920— 377 (11/2018)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක (2) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් පහත පරිදි :-

(2) **මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය**

### *I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. මහවැලි සංවර්ධන, ඉඩම් සහ පරිසර විෂයයට හා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. මහවැලි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
3. මහවැලි අධිකාරි පනත යටතේ සඳහන් කාර්යයන් සහ ඒ යටතේ පිහිටුවන ලද සංවිධාන හා සම්බන්ධිත කටයුතු
4. වර්තමාන හා අනාගත පරපුර උදෙසා පරිසරය සුරැකීම වෙනුවෙන් ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම
5. තිරසර සංවර්ධනය උදෙසා දායකත්වය ලබාදීම
6. පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදනය කිරීම
7. කැලෑ සහ වන විද්‍යා කටයුතු
8. වනාන්තර, වනසතුන් හා තුරුලතා ආරක්ෂා කිරීම හා සංරක්ෂණය
9. රටේ දැව අවශ්‍යතාවය සපුරා ගැනීමේ අරමුණින් වාණිජ වන වගාව ප්‍රවර්ධනය කිරීම

### *II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටප්‍රයිස් සමාගම හැර)
2. මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ව්‍යාපෘතිය
3. වේලි ආරක්ෂණ සහ ජලසම්පත් සැලසුම් ව්‍යාපෘතිය
4. මහවැලි ඒකාබද්ධ (කලාප බී පුනරුත්ථාපන) ව්‍යාපෘතිය
5. උඩවලව වම් ඉවුර ව්‍යාපෘතිය
6. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
7. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
8. මධ්‍යම පරිසර අධිකාරිය
9. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
10. සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම
11. රාජ්‍ය දැව සංස්ථාව
12. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
13. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය
14. ලංකා ටිම්බර් ප්ලාන්ට් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස්

### *III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- ශ්‍රී ලංකාවේ මහවැලි අධිකාරිය පනත (1979 අංක 23)
- කැලෑ ආඥාපනත (453 අධිකාරය)
- පතල් හා ඛනිජ පනත (1992 අංක 33)
- ජාතික පාරිසරික පනත (1980 අංක 47)
- ජාතික උරුම වනභූමි පනත (1988 අංක 3)
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත (1993 අංක 50)
- සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ පනත (2008 අංක 35)
- වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57)
- ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත (2017 අංක 4)
- ඉඩම් අත්කර ගැනීමේ පනත (1950 අංක 9)
- ඉඩම් සංවර්ධන ආඥාපනත (1935 අංක 19)
- ඉඩම් ආපසු පවරා ගැනීමේ ආඥාපනත (1942 අංක 61)
- ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත (1931 අංක 20)
- රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත (1979 අංක 43)

**උපලේඛනය (සම්බන්ධිතයි)**

**(2) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය (සම්බන්ධිතයි)**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

10. පරිසර දූෂණය මැඩලීම පිණිස වැඩසටහන් සම්පාදනය කිරීම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම
11. සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු
12. වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය
13. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළෙඳාම ප්‍රවර්ධනය හා නියාමනය
14. පරිසර වෙනස්කම් සහ කාබන් භාවිතය අවම ආර්ථිකයක් සහිත තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා නීති සහ උපාය මාර්ග සම්පාදනය කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
15. රජයේ ඉඩම් පරිපාලනය, කළමනාකරණය හා ඉඩම් පරිහරණ සැලසුම්කරණය
16. ඉඩම් නිරවුල් කිරීම හා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු
17. රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම
18. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පරිපාලනය හා නීත්‍යානුකූලව බෙදා දීම
19. ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් ලබාදීම
20. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
21. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

15. සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරිය
16. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
17. තිරසර සංවර්ධන සභාව
18. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්
19. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව
20. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
21. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
22. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
23. මිනුම්පති දෙපාර්තමේන්තුව
24. මිනින්දෝරු සහ සිතියම් ආයතනය
25. ඉඩම් මැනුම් සභාව
26. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- රජයේ ඉඩම් ආඥාපනත (1947 අංක 8)
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත (1972 අංක 1)
- රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත (1979 අංක 7)
- මැනුම් පනත (2002 අංක 17)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

(2) එම නිවේදනයෙහි "අංක (9) කෘෂිකර්ම අමාත්‍ය'' ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් පහත පරිදි :-

(9) **කෘෂිකර්ම අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. කෘෂිකර්ම විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. දේශීය ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම
3. නවීන තාක්ෂණය යොදා ගනිමින් කෘෂිකාර්මික නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන උපායමාර්ග හා සැලසුම් සකස් කිරීම
4. භෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
5. විවිධ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන් සඳහා විධිමත් පුහුණුවක් ලබාදීම, අධ්‍යාපන හා පර්යේෂණ අවස්ථා පුළුල් කිරීමට ක්‍රමවේද සැකසීම
6. කෘෂි නිෂ්පාදනයන්හි අගය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමෝපායන් හඳුන්වා දීම
7. කෘෂි නිෂ්පාදන මත පදනම් වූ ව්‍යවසායකයින් දිරිගැන්වීම හා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීමට පියවර ගැනීම
8. දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම
9. කුඹුරු ඉඩම් සම්බන්ධ සියලු කටයුතු ඉටුකිරීම
10. ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම සහ සමාජ ආරක්ෂණ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. ගොවිජන සංවර්ධන

   දෙපාර්තමේන්තුව
3. ජාතික පොහොර ලේකම් කාර්යාලය
4. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
5. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
6. ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය
7. මාංශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය
8. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
9. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
10. පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය
11. සීමාසහිත ලංකා පොහොර සමාගම
12. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
13. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්
14. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම
15. වී අලෙවි මණ්ඩලය
16. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම)

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)
- පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)
- ගස් හෙලීම (පාලන කිරීම) පනත (1951 අංක 9)
- ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනත (1973 අංක 15)
- පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)
- බීජ වී පනත (2003 අංක 22)
- පස් සංරක්ෂණ පනත (1996 අංක 24)
- කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)
- පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)
- ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)
- වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)
- කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1978 අංක 11)
- අපනයන කෘෂි සංවර්ධන පනත (1992 අංක 46)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

(9) **කෘෂිකර්ම අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව* <br> *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* <br> *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* <br> *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
|---|---|---|
| 11. ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදාහැරීම තුළින් පොහොර සහනාධාර වැඩසටහන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම | 17. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| 12. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය | 18. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය | |
| 13. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට සම්බන්ධ කාර්යයන් | | |
| 14. එළවළු සංවර්ධන මණ්ඩලයේ හා පළතුරු සංවර්ධන මණ්ඩලයේ වත්කම් හා අනෙකුත් සම්පත්වලට අදාළ කටයුතු | | |
| 15. කාබනික පොහොර නිෂ්පාදනය සහ වස විසෙන් තොර ගොවිතැන ප්‍රචලිත කිරීම | | |
| 16. කෘෂිකාර්මික සංවර්ධන කලාප, කෘෂි ගම්මාන හා තිරසර ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් ප්‍රචලිත කිරීම | | |
| 17. වී, ධාන්‍ය හා අනෙකුත් කෘෂි භෝග මිල දී ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා අළෙවියට අදාළ කටයුතු කිරීම | | |
| 18. අගය එකතු කිරීම, අපනයන වෙළෙඳපොළ අවස්ථා වැඩි දියුණු කිරීම, කර්මාන්ත සුරක්ෂිතභාවය ඇති කරමින් ගොවීන්, ධීවරයින් සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරීම සඳහා ප්‍රතිපත්ති, උපායමාර්ග සම්පාදනය කිරීම | | |
| 19. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 20. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(3) එම නිවේදනයෙහි "අංක (11) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය'' ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් පහත පරිදි :-

(11) **අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. අධ්‍යාපන, උසස් අධ්‍යාපන, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම,පසු විපරම් කිරීම හා ඇගයීම
2. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතියික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවයක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම සහ සම්පාදනය කිරීම
3. ලෝක තරගකාරීත්වයට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම
4. ජාතික පාසැල් සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
5. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම
6. පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය
7. ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා පරිගණක විද්‍යාගාර ඇතුළු නූතන තාක්ෂණික පහසුකම් යොදාගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය
8. රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ඉගෙනුම් උපකරණ සහ

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. විභාග දෙපාර්තමේන්තුව
2. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. ජාතික අධ්‍යාපන ආයතනය
4. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
5. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
6. අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල
7. ගුරු අධ්‍යාපනය පිළිබඳ ජාතික අධිකාරිය
8. අධ්‍යාපන විද්‍යාපීඨ
9. ගුරු විද්‍යාල
10. ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම
11. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය
12. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු විශ්වවිද්‍යාල
15. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලුම පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන
16. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
17. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ආධාර ලබන පාසල් සහ අභ්‍යාස විද්‍යාල පනත (1960 අංක 5)
- අධ්‍යාපනික විද්‍යායතන පනත (1986 අංක 30)
- ගුරු අධ්‍යාපනය පිළිබඳ ජාතික අධිකාරිය පනත (1997 අංක 32)
- ජාතික අධ්‍යාපන ආයතන පනත (1985 අංක 28)
- රජයේ විභාග පනත (1968 අංක 25)
- පාසල් සංවර්ධන මණ්ඩල පනත (1993 අංක 8)
- යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනත (1999 අංක 44)
- රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24)
- විශ්වවිද්‍යාල පනත (1978 අංක 16)
- බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)
- ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74)
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995 අංක 29)
- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66)
- විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත (1994 අංක 11)
- අනුකූලතා ඇගයීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත (2005 අංක 32)

උපලේඛනය (සම්බන්ධිතයි)

(11) **අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| පහසුකම් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම | 18. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය<br>19. මහපොළ භාරකාර අරමුදල | ■ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6) |
| 9. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය | | ■ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම් පනත (1979 අංක 53) |
| 10. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම | 20. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | ■ ශ්‍රී ලංකාවේ මූලික අධ්‍යයන ආයතන පනත (1981 අංක 55) |
| | 21. ජාතික මූලික අධ්‍යයන ආයතනය | ■ ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත (1998 අංක 59) |
| 11. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම | 22. ජාතික විද්‍යා පදනම<br>23. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 12. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ පිරිස් කළමනාකරණ කටයුතු | 24. ග්‍රහලෝකාගාරය<br>25. නවීන තාක්ෂණවේදය සඳහා වන ආතර් සී ක්ලාක් ආයතනය | |
| 13. ඵලදායී ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම හා ධාරිතා සංවර්ධනය | 26. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br>27. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | |
| 14. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | 28. ශ්‍රී ලංකා නිමැයුම්කරුවන්ගේ කොමිසම | |
| 15. පාසල් සංවර්ධන මණ්ඩල පරිපාලනය | 29. නිමැයුම්කරුවන්ගේ අරමුදල<br>30. ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | |
| 16. අධ්‍යාපන ආයතන නීතිගත කිරීම | | |
| 17. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම | 31. ජාතික පර්යේෂණ සභාව<br>32. කාර්මික තාක්ෂණ ආයතනය<br>33. හරිත වර්ධන කාර්යාංශය | |
| 18. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධවීම හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම | 34. විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ලේකම් කාර්යාංශය | |

**උපලේඛනය** (සම්බන්ධිතයි)

(11) **අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 19. උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ගයන් පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්ණායකයන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 20. රැකියා වෙළෙඳපොළ ඉල්ලුමට ගැළපෙන උපාධිධාරීන් බිහිකිරීමට විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සංශෝධනයන් සිදුකිරීම හා ඊට අවශ්‍ය මානව සම්පත් සැපයීමට සුදුසු පියවර ගැනීම | | |
| 21. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මගින් ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා සඳහා අන්තර්ජාතික පිළිගැනීම ලබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 22. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය කිරීම හා ප්‍රතීතනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 23. බෞද්ධ හා පාලි අධ්‍යයනය ඉහළ නැංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම | | |
| 24. තරුණ ප්‍රජාව වෙනුවෙන් උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම | | |
| 25. අන්තර්ජාතික වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල සිදුවන පර්යේෂණයන්හි නව සොයා ගැනීම්වලට අනුගතවන පරිදි දේශීය පර්යේෂණ හා සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම | | |
| 26. විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |

**උපලේඛනය** (සම්බන්ධිතයි)

(11) **අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 27. පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම | | |
| 28. තොරතුරු, නැනෝ හා ජෛව තාක්ෂණයද ඇතුලුව නව පර්යේෂණ හා සොයා ගැනීම් වලින් ලබාගන්නා ප්‍රතිඵල හා දැනුම ව්‍යාපාරික ප්‍රජාවද ඇතුලුව අදාළ පාර්ශවයන් වෙත ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ නැනෝ තාක්ෂණය හා ජෛව තාක්ෂණය පිළිබඳ උසස් පර්යේෂණ හා අධ්‍යාපන පර්යේෂණ මධ්‍යස්ථාන ඇති කිරීම | | |
| 29. ප්‍රමිතීන් පැනවීම සහ පරිපාලනය සම්බන්ධ කටයුතු | | |
| 30. වෙනත් අමාත්‍යාංශ විෂය පථය යටතේ ගැනෙන පර්යේෂණ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ සඳහා තාක්ෂණික සහාය ලබාදීම | | |
| 31. නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 32. ඉදිකිරීම් කර්මාන්තය ප්‍රවර්ධනය, සංවර්ධනය සඳහා වූ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම | | |
| 33. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 34. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(4) එම නිවේදනයෙහි "අංක (16) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් පහත පරිදි :-

(16) **නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු, ජනමාධ්‍ය හා ඩිජිටල් යටිතල පහසුකම් විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම,පසු විපරම් කිරීම හා ඇගයීම
2. පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම
3. රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම
4. ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම
5. වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
6. ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම
7. ජනතාව තුළ දැනුම, ආකල්ප සහ රසඥතාවයන් ඇති කරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
3. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය
4. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
5. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
6. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා අනුබද්ධ ආයතන
7. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
8. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
9. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)
10. ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය
11. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
12. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
13. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
14. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
15. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
16. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
17. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18)
- තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)
- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)
- ජාතික මානව සම්පත් සංවර්ධන කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත (1997 අංක 18)
- ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)
- ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37)
- ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5)
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8)
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත (1973 අංක 5)
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982 අංක 6)

උපලේඛනය (සම්බන්ධිතයි)

(16) **නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය** (සම්බන්ධිතයි)

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

8. ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම

9. උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

10. රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

11. ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම

12. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම

13. ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම

14. දෙපාර්තමේන්තු ප්‍රකාශන හැර රජයේ ප්‍රකාශන අලෙවිය, ගබඩා කිරීම සහ නිකුත් කිරීමේ කටයුතු

15. ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම

16. වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු

17. රාජ්‍ය අංශයේ සේවා සැපයීමේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා උචිත තොරතුරු තාක්ෂණ විසඳුම් යොදාගැනීමට සහාය වීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

18. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

19. සීමාසහිත ලංකා පුවත් ආයතනය

20. සැලසිනේ රූපවාහිනී ආයතනය

21. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි-සිනමා උද්‍යානය (රන්මිහිතැන්න)

22. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

23. සියලුම තොරතුරු තාක්ෂණ උද්‍යාන

24. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12)
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)
- ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(16) **නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 18. පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 19. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම දිරිගැන්වීම සඳහා ක්‍රමෝපායන් සැකසීම් | | |
| 20. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 21. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(5) එම නිවේදනයෙහි "අංක (19) ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍ය'' ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් පහත පරිදි :-

(19) **ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව<br>2. රාජ්‍ය භාෂා කොමිසම<br>3. භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය<br>4. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ලේකම් කාර්යාලය | ■ රාජ්‍ය භාෂා පනත (1956 අංක 33)<br>■ රාජ්‍ය භාෂා කොමිසම පනත (1991 අංක 18)<br>■ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත (2007 අංක 26)<br>■ ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත (1980 අංක 31) |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(19) ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 2. ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඒ හා සම්බන්ධ කටයුතු | 5. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය (අමාත්‍යාංශයේ මෙහෙවර ක්‍රියාත්මක කිරීමේ ආයතනයකි) | ■ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම) පනත (2016 අංක 14) |
| 3. රට තුළ ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානයත් කල් පවත්නා සාමයත් ප්‍රවර්ධනය කරලීම | 6. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 4. ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම | | |
| 5. ජාතික ඒකාබද්ධතාව කෙරෙහි බලපාන සම්බාධක හඳුනා ගැනීම හා අදාළ පාර්ශව සමග පැවැත්වෙන සාකච්ඡා හා කතිකා පාදක කොට ගෙන ප්‍රතිපත්තිමය වශයෙන් පියවර ගැනීම | | |
| 6. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධානය සඳහා කටයුතු කෙරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමග සහයෝගීත්වයෙන් ක්‍රියා කරමින් අන්තර් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගැටලු ඇතොත් ඒවා සමනය කිරීම | | |
| 7. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධානය පිළිබඳව දැනට ක්‍රියාත්මක කෙරෙන සහ යථා කාලයේ දී ක්‍රියාත්මක කිරීමට උචිත විවිධ උපාය මාර්ග සමාලෝචනය සහ ගැටලු නිරාකරණයට මැදිහත් වීම | | |
| 8. ක්ෂේත්‍ර මට්ටමේ දී ක්‍රියාකරනු ලබන අදාළ වැඩසටහන් හා ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම | | |
| 9. ඉහත සඳහන් වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය වේ නම් අරමුදල් යථායෝග්‍ය ක්‍රමවේද අනුව සෙවීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(19) ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 10. ජාතීන් අතර සහයෝගීතාව සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය සංවාද වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම | | |
| 11. ප්‍රධාන ජාතික භාෂාවන් හා සන්ධාන භාෂාව උපයෝගී කරගනිමින් ජාතීන් අතර සංස්කෘතික සමාජමය හා ආගමික පසුබිම අන්‍යෝන්‍ය වශයෙන් අවබෝධ කරගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම | | |
| 12. ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය ප්‍රවර්ධනය සඳහා ජාතික සමගිය හා සහජීවනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව ප්‍රතිපත්ති සකස් කිරීම | | |
| 13. කල්පවත්නා සාමයක් ගොඩනැගීමට ජාතික සමගිය හා සහජීවනය සඳහා අවශ්‍යවන්නා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් පිළිබඳ රජයේ බලධාරීන්ට උපදෙස් ලබාදීම | | |
| 14. සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේ දී පැනනැගිය හැකි ගැටළු සම්බන්ධයෙන් රජයේ බලධාරීන්ට උපදෙස් ලබාදීම | | |
| 15. එවැනි ගැටළු සඳහා සුදුසු විසඳුම් සෙවීමට යෝජනා ඉදිරිපත් කිරීමේ දී රජයේ බලධාරීන්ට උපදෙස් දීම | | |
| 16. සර්ව සහභාගීත්ව සමගි සම්පන්න සමාජයක් ගොඩනැංවීමටත්, සහජීවනය ප්‍රවර්ධනය කරලීම පිණිසත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම | | |
| 17. ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අදාළ වැඩසටහන් හා ක්‍රියාකාරකම් අධීක්ෂණය හා ඇගයීම | | |
| 18. විවිධ ප්‍රජාවන් තුළ හා අතර ඇතිවිය හැකි මතබේද හා ගැටුම් සඳහා හේතු පාදක වන කරුණු විසඳීම සඳහා වන ක්‍රියාමාර්ග රජයට යෝජනා කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

(19) **ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව* <br> *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* <br> *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* <br> *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 19. ප්‍රජාවන් තුළ හා අතර ගැටුම්කාරී අවස්ථාවන්ට තුඩුදිය හැකි දැඩි මතබේදකාරී අවස්ථාවන් හඳුනා ගැනීම සහ එවැනි අවස්ථාවන් සමනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම හා නිර්දේශයන් ඉදිරිපත් කිරීම | | |
| 20. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය මගින් දියත් කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් අදහස් හා සහභාගීත්වය ලබාගැනීම සඳහා, රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ රාජ්‍ය නොවන අංශ සමග සංවාද පවත්වා ගැනීම | | |
| 21. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන පරීක්ෂණ කොමිෂන් සභාවේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වූ විට මැදිහත් වීම | | |
| 22. මූල්‍යමය ආධාර සහ විශේෂඥතාවය ලබාගනු පිණිස ජාත්‍යන්තර ප්‍රජාව සමග සම්බන්ධතා ගොඩනැගීම | | |
| 23. යෝග්‍ය ක්‍රමවේද යොදා ගනිමින් අවශ්‍ය වන්නේ නම් උක්ත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කරගැනීම | | |
| 24. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම) පනතට අදාළ සියලුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම | | |
| 25. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 26. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.